## දිලිනි ඊරියවල

හලෝ... ඔව්... විමලනාතතමයි...ආහ්...නිමලෙ

මොකෝ බං අල්ලපුගෙදර ඉඳල මේ කෝල් කරන්නෙ?
........
නෑහ් මේ මහ දවල්? මේ..මේ.. අද?

විමලනාතගෙ විමතිය මුසු හඬ ඇසුන බිරිඳ කුස්සියෙ සිට සාලයට දුවගෙන ආව.
දැං උඹ ඉන්නෙ කොහෙද?... ආ..හා..හා... මං දැන් පොලිසියට එන්නද?
.... හරි මං කෙලින්ම පොලීසියට එන්නං... හරි .හරි...

දුරකතනය තැබූ විමළනාත ඉදිරියේ මුහුණට ප්‍රශ්නාර්ථයක් නගාගෙන බලාසිටි බිරිඳට කිසිත් නොකියා ම වේගයෙන් කාමරය දෙසට ඇදුනා.

කව්ද කතා කළේ? මොකද්ද වෙලා තියෙන්නෙ? ඇයි මේ කළබලේ? කවුරු හරි මැරිලද? කාවද පොලිසි ගෙනිහින් තියෙන්නෙ? අනේ මේ ඔයා එහෙම ඇපදෙන්න ඉදිරිපත්වෙන්නෙ නෑ ඔන්න හොඳේ? මාස දෙකකට කලින් උගස් තිබ්බ රත්තරං බඩුටික බේරගත්ත විතරයි. මොක්ද්ද වෙලාතියෙන්නෙ මනුස්සයො?

එකවර ප්‍රශ්න වැලක් ඉදිරිපත්කිරීමත් ඒවාට එක පිළිතුරක් හෝ දුන්නොත් ඒ එක පිළිතුර සම්බන්ධයෙන් තවත් ප්‍රශ්න වැලක් ඉදිරිපත් කිරීමත් සිය බිරිඳ ගේ චරියාව වගදන්නා නිසාදෝ, විමලනාත වදනක් හෝ පිට කළේ නෑ. ඔහු කමිසයේ බොත්තම් දමමින්ම වාහනයට නැගී එන්ජිම පණගන්වා ගත්තා.

චිත්‍රාංගනී යළිත් මුළුතැන්ගෙට වැදුනා.

මොකක් වෙන්න ඇත්ද? නැන්දම්මට අසනීපයක්වත් වෙලාද? හැබැයි වෙන්නත් බෑ... උන්ද ගලේ ගැහුවත් අද හෙට නම් යන්නෙ නෑ... එහෙනම් අපෙ අම්මවත් ද? අනේ දෙයියනේ... මගෙ රත්තරං අම්මට නම් මොකුත් වෙන්න එපා....

චිත්‍රාංගනීගෙ දෙනෙත් කඳුලින් බරවුනා

නෑ නෑ එහෙම වෙන්න බෑ. කවුරු හරි පොලීසියට අල්ලගෙන ගියාවගේ දෙයක්නෙ කතා වුනේ... අපේ කෙනෙක් නම් වෙන්න බෑ... හත්දෙයියනේ ලොකුපුතාවත් ද? මං කොච්චර කිව්වද හන්දියෙ කොලූරංචුවට වැටිල රස්තියාදු ගහන්න එපා කියල... අනේ දෙයියනේ මං කාට කියන්නද?... ගිය සුමානෙත් මිස්ටර් සමරරත්න ගෙවත්තෙ හොර පොල්කඩල අහුවුනා... තාත්තණ්ඩිගෙන් අච්චර කාලත් මේක ආයෙත් මොන ජරමරයක් කරගත්තද?

කුස්සියෙ පුටුවකට බරවුනු චිත්‍රාංගනීට එලෝ මෙලෝ නැතුව ගියා.

අල්ලපු ගෙදර මිසිස් නිමල්සිරිටවත් කතාකරල මේ ගැන කියන්නත් හිතෙනව. ඒත් දෙයියනේ අම්මකෙනෙක් කොහොමද කටක් ඇරල තමන්ගෙ පුතා පොලීසියෙන් ගෙනිච්චයි කියල තවත් ගෑණියෙක්ට කියන්නෙ? අනික මං දැක්කෙත් නෑනෙ ගෙනියනව... ඒත්... ඒත් විමලෙ අච්චර කලබල වුනේ ඇයි එහෙනං? නෑ නෑ අපේ ලොක්කවම තමා ගෙනියන්න ඇත්තෙ... දෙයිහාමුදුරුවනේ.. මුන්ව ඉහේ මූණෙ තියාගෙන අන්ඩක්කැඩෙන්න නොදී හැදුවටද අපිට මෙහෙම ගින්දර දෙන්නෙ? අර මනුස්සය තේ එක බොන්න අතට ගත්ත විතරයි...

චිත්‍රාංගනී ඉකිගසන්න පටන්ගත්ත. දරු දුකට. දුරකතනය නාද වුනා. ඊලග මොහොතෙ චිත්‍රාංගනී හිටියෙ දුරකතනය කන තබාගෙන.

ඔයා අද දවල් එළියට එහෙම ගියාද? විමලනාත ආමන්ත්‍රණයක් හෝ නැතිවම කළබලෙන් වගේ ඇහුව
ඔව්... කඩේට ගියා ඇයි? මුදලාලි එතකොට නං හොඳට හිටිය... ඇයි කරදරයක්ද? ලොකු පුතා හම්බුනාද? කාට හරි අමාරුද? පොලීසියෙන් ගහලද? අනේ...
ගිහින් බලනව රත්තරං බඩු ටික තිබ්බ තැනම තියනවද කියල

සැරෙන් කී විමලනාත දුරකතනය විසන්දි කලා

මේ මනුස්සය කියන හරුපෙ මට තේරෙන්නෙ නැති හැටි... චිත්‍රාංගනී හිතන්න ගත්ත

එතකොට ලොකුඑකා මගෙ රත්තරං බඩු ටික අරං යද්දිද අල්ලල තියෙන්නෙ?

චිත්‍රාංගනී අඩියට දෙකට අල්මාරියේ යටම තට්ටුවේ රෙදිගොඩ අස්සෙ හැංගුනා. දිග සුසුමක් එක්කම ඈ යළි රෙදි ගොඩ තුලින් නාගදේනුවක් සේ එලියට ඇදුන.

මේ තියෙන්නෙ ඔක්කොම?

දෝතට පිරුනු රත්තරන් බඩුවල දිස්නෙ චිත්‍රාංගනීගෙ දෙනෙතින් කාන්දු වුනා.
හම්මේ... මේ ටිකට විදල තිබුනනං ලොකුපුතාට බලාගන්න තිබුන අම්ම කව්ද කියල. ඒත් එහෙනං මේ කොල්ලව පොලීසියෙන් ගෙනිච්චෙ මොකටද?

# මිනීමැරුම

මං දන්නව මගෙ පුතා ඔය ගහක ගෙඩියක් කැඩුවට හොරෙක් නෙමෙයි.

ඈ දිග සුසුමක් හෙලූව
දුරකතනය යලි නාද වුනා

හලෝ
රත්තරං බඩු තිබුනද?
ඔව්

ඉක්මණින් මල්ලක දාල තව වටින කියන දෙයක් තියනව නම් ඒවත් එකතුකරල තියන්න. මං ඉක්මනින් එන්නම්
ඇයි මොකද? ලොකු පුතා මිනියක්වත් මරලද? අනේ කියන්න...
දුරකතනය නැවතත් විසන්දි වුනා

දෙයියනේ මේ මොනවද අපිට වෙන්න යන්නෙ? විමලෙ හදන්නෙ අපි හැමෝවම අරං නීතියෙන් හැංගෙන්නද? ඇයි පුතේ අපේ මූණෙ දැලිගෑවෙ?

ඉකිය අතරින් චිත්‍රාංග නීතමාටම කියාගත්ත. ඊලග මොහොතෙ චිත්‍රාංගනී හිටියෙ පොඩි පුතාවත් සූදානම් කරගෙන ලොකුම ලොකු මලූ දෙකක් දොරකඩ තියාගෙන හැඩූ කඳුලින්. සක්විති රණසිංහ කියන පල් හොරා නීතියෙන් හැංගි හැංගි හිටියවෙලාවෙ රටටම පේන්න පොලීසියෙන් ගෙනිච්චහැටිත් ඔහුගෙ බිරිඳ මිනිසුන්ගෙන් මුහුණස ගවාගන්න උත්සාහ කෙරුව හැටිත් චිත්‍රපටයක මෙන් ඈ ඉදිරියේ දෘෂ්‍යමාන වෙන්න ගත්ත. කඳුළු රූරා වැටුන. සුසුම් කුණාටුවක් හැමුව. හීන කඩාගෙන වැටුන.

ඒ එක්කම විමලෙගෙ වාහනේ ඈ ඉදිරියේ නැවතුනා. විමලනාත වාහනෙන් බසින්නතැත් කරද්දිම,
ඔයා බහින්න එපා. යං පොඩි පුතේ නගිමුඬඳ

චිත්‍රාංගනී කාරයට පුරවාගත් ලොකුමලූ දෙක දඩිබිඩියෙ පැටෙව්ව.

මේ මොකද?

විමලනාත චිත්‍රාංගනීව විමසමින් කාරයෙන් බැස්ස. කඳුලූ පිසිමින් චිත්‍රාංගනී වාහනේ වාඩිවුනා.

අපි දැන් කොහෙද යන්නෙ විමලෙ? ලොකු පුතාව කොහෙද තියල ආවෙ? අපිට මොකද්ද මේ වෙන්න යන්නෙ? පොඩි පුතාගෙ ඉස්කෝලෙට මොකද කරන්නෙ? එතකොට අපේ අයිඩෙන්ටිකාඩ්?

සුපුරුදු දිනචරියාව කොහෙ අරින්නද? චිත්‍රාංගනී ප්‍රශ්න වැලකින් විමලනාතව පිස්සු වැට්ටුව.

මොනවද මේ කියන්නෙ?
එහෙනම් මොකටද රත්තරං බඩු බලන්න කිව්වෙ? මොකටද පොලීසි ගියෙ? කව්ද පොලීසි එන්න කිව්වෙ? ලොකු පුතා තාම කූඩුවෙද?

පිස්සුද? එහෙම මොකුත් නෑ. අල්ලපු ගෙදරට දාවලේ හොරු පැනල.... නිමලෙ පොලීසි ගිහින් ඇන්ට්රියක් දාන්න.. මං ගියෙ මිනිහගෙ උදව්වට. වටින බඩු එකතැනක තියන්න කිව්වෙ, බැංකුවෙ ලාච්චුවක තැන්පත් කරන්න... මේ මොනවද පොදිගහ ගෙන ඉන්නෙ?

කටකොණින් හිනාවෙන ගමන් විමලනාත ගෙට ගොඩවුනා
කාරයට දමාපු බරමලූ දෙකත් ඇදගෙන චිත්‍රාංගනිත් පසුගමන් කළා. අන්දමන්දවී සිටි පොඩි පුතා කාරයටම වී මේ පුදුමය තේරුම්ගන්න උත්සාහ කළා. ලොකු පුතා පන්ති ඇරිල හවස ලස්සනට ගෙදර ආව.


# D&M Lawyers

Suite 2, Level 1, 767 HIGH STREET
EPPING VIC 3076
Tel: (03) 9408 0837

**Like our clients our lawyers come from diverse backgrounds and bring a wealth of different experiences and expertise**

**D&M Lawyers is a boutique law firm located in Epping, 22km north from the Melbourne CBD.**

**Legal Aid available, if applicable**
**Language spoken: English, Sinhalese, Italian and Macedonian**
**All other languages available through interpreters**

**Our areas of expertise include:**
Property & Conveyancing
Immigration
Intervention Orders
Family Law
Wills & Power of Attorneys
VOCAT – Victims of Crime Compensation

FIRST CONSULTATION
**FREE**

**CONTACT US**
**(03) 9408 0837 or via email at admin@dandmlawyers.com.au**

**www.dandmlawyers.com.au**